**සිරකරු සුභසාධක අරමුදල - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

සිරකරු සුභසාධක අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍යවන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද " අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2. ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිරකරු සුබසාධක අරමුදලේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව අරමුදල වෙත පරිත්‍යාග වශයෙන් ලැබෙන ජංගම නොවන වත්කම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන මගින් දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද රු.1,731,476 ක් සහ වටිනාකම නොදන්නා විෂයයන් 09 කට අදාළ ජංගම නොවන වත්කම් බන්ධනාගාර දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන තුළ හෝ සිරකරු සුබසාධක අරමුදල තුළ ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ වත්කම් පිළිබඳව ප්‍රතිපත්තිය ලෙස ආයතනයට ලැබෙන සියලුම පරිත්‍යාග බන්ධනාගාරයේ ප්‍රධාන ගබඩාවේ ඇති ලෙජරයේ සටහන් කර පාරිභෝජන භාණ්ඩ එම ලෙජරයෙන් අවශ්‍යතාවය පරිදි බන්ධනාගාර වෙත මුදාහැරීම සිදු කරන අතර, පරිත්‍යාග වශයෙන් ලැබෙන ස්ථාවර වත්කම් විසර්ජන ගිණුම මගින් ගිණුම්ගත කිරීම සිදුකරනු ලබයි. | අරමුදල වෙත පරිත්‍යාග වශයෙන් ලැබෙන ජංගම නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය. |
| (ආ) | සිරකරු සුබසාධනය වෙනුවෙන් බන්ධනාගාර ආයතන වෙත ලැබෙන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් හඳුනාගෙන හෝ හෙළිදරව් කිරීමක් කර හෝ නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විෂයයන් 94 කට අදාළ වටිනාකම රු.1,996,297 ක් හා වටිනාකම නොදන්නා විෂයයන් 136 ක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | බන්ධනාගාර ආයතනවලට ලැබෙන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අවශ්‍ය නොවේ. | පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් හඳුන්වාදී ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු ය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877(2)(අ) ඡේදය | අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වා නොමැති අතර, සුභසාධක අරමුදලේ ගනුදෙනු දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම යටතේ ඉටුකරගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 877 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ප්‍රකාරව අරමුදලක් සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වා ගත යුතු බැවින් සිරකරු සුභසාධක අරමුදලට වෙනම බැංකු ගිණුමක් විවෘත කිරීමට අදාළ කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතින බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 877(2)(අ) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.403,785 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.758,638 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.354,853 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂය තුළ අරමුදල වෙත ලැබී ඇති ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බන්ධනාගාරගත වූ රැඳවියන් තුළ පවතින කලා කුසලතාවයන් වර්ධනය කර බන්ධනාගාර නිලධාරීන් හා ඔවුන් අතර සුහදතාවය ඇති කිරීමේ අරමුණින් බන්ධනාගාරයේ මානව හා භෞතික සම්පත් යොදාගෙන ලලිත සිරිසර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර, මෙම ව්‍යාපෘතියට අදාළව රුපියල් මිලියන 8.5 ක ආදායමක් රැස්කර තිබූ අතර, රුපියල් මිලියන 1.1 ක සංග්‍රහ වියදම් ද ඇතුලුව රුපියල් මිලියන 4.7 ක වියදමක් දරා ඉතිරි මුදල් ලෙස රුපියල් මිලියන 3.75 ක් වැලිකඩ සිරකරු සුභසාධක උප සංගමයේ බැංකු ගිණුමේ පවත්වාගෙන යනු ලබයි. සිරකරු සුභසාධන අරමුදල මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ නම් මෙම ඉතිරි මුදල් විධිමත්ව සිරකරු | සිරකරු සුභසාධක සංගම් පිහිටුවා මේ වන විට වර්ෂ ගණනාවක් ගතවී තිබුණ ද මෙම ව්‍යාපෘතිය සිරකරු සුභසාධක අරමුදල හරහා සිදු කිරීමට හැකියාවක් නොමැති අතර, එහි ඇති ශේෂය බන්ධනාගාර ආයතන සියල්ලෙහිම පුනරුත්ථාපන වැඩසටහන් සඳහා ප්‍රමාණවත් නොවන බව දක්වා ඇත. | සිරකරු සුභසාධක අරමුදල මගින් මෙවැනි ව්‍යාපෘතිය සිදු කිරීමට පියවරගත යුතු ය. |

| විගණන නිරීක්ෂණය | | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සුහසාධනය සඳහා යොදා ගැනීම මෙන්ම රජයේ විගණනයට ද භාජනය වන අතර, එය වඩා විනිවිදභාවයකින් සිදු කිරීමට රජයේ සම්පත් යොදාගෙන සිදු කළ මෙම ව්‍යාපෘතියට හැකියාව පවතින බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | සිරකරු සුහසාධක අරමුදලින් සිරකරු සුහසාධන වැඩසටහන් නිවැරදිව පුරෝකථනය කර තාත්වික ලෙස වියදම් ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා මුල් ඇස්තමේන්තුවේ අපේක්ෂිත කාර්යසාධනයට සාපේක්ෂව සත්‍ය වශයෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් සංඛ්‍යාව සියයට 3 ක් විය. | මුලින් සකස් කළ ඇස්තමේන්තුව සංශෝධනය කිරීම මත අපේක්ෂිත වැඩසටහන් ද ඒ අනුව අඩු කිරීමට සිදු විය. තව ද 2023 වර්ෂය සඳහා සිරකරු සුහසාධක අරමුදලින් වියදම් කිරීමට අනුමැතිය ලබාදෙන ලද්දේ ජූලි මස බැවින් සිරකරු සුහසාධක අරමුදලින් වැඩසටහන් ක්‍රියාත්මක වූයේ 2023 අගෝස්තු මස සිට ය. මෙහි සඳහන් වනුයේ අගෝස්තු මස සිට ක්‍රියාත්මක කළ වැඩසටහන් ගණන වේ. සිරකරු සුහසාධක අරමුදලින් මුදල් වියදම් කිරීමේ අනුමැතිය වර්ෂය මුලදී ලබාගෙන එකී කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇත. | අරමුදලේ ඇස්තමේන්තු තාත්විකව සකස් කර නිවැරදි කාලරාමු තුළ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිරකරු සුහසාධක අරමුදලේ 2023 වර්ෂය සඳහා මුල් ඇස්තමේන්තුව අනුව අපේක්ෂිත ආදායම රු.858,500 ක් සහ අපේක්ෂිත වියදම රු.1,500,000 ක් විය. සිරකරු සුහසාධනය සඳහා ප්‍රමාණවත් මුදලක් වැය කිරීමට හැකියාව තිබියදී අරමුදලේ මුල් ඇස්තමේන්තුවේ වියදම සියයට 53.3 ක් දක්වා එනම් රු.800,000 ක් දක්වා අඩුකර තිබූ අතර, 2023 වර්ෂය තුළ සත්‍ය ආදායම රු.1,172,126 ක් ද, සත්‍ය වියදම රු.768,341 ක් විය. තව ද සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.5,299,068 ක හා සමාලෝචිත වර්ෂය අවසානයේ සිරකරු සුහසාධක අරමුදලේ රු.5,696,914 ක ශේෂයක් පැවති බැවින් සිරකරු සුහසාධනය සඳහා ප්‍රමාණවත් මුදලක් වැය කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂ සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී අරමුදලේ ශේෂය පරීක්ෂාකර බලා වැඩි මුදලක් වැඩසටහන් සඳහා ලබාදීමට කටයුතු කරන බව දන්වා ඇත. | සිරකරු සුහසාධනය පාදක කරගෙන අරමුදලේ ඇස්තමේන්තු තාත්විකව සකස් කර එපරිදි වියදම් දැරීමට කටයුතු කළ යුතු ය. |